# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/EST/02/02/CMA(iv) | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........ | දිනය<br>திகதி<br>Date 2026.01. 21 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>අඩු සුදුසුකම් සහිත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සේවයෙන් විශ්‍රාම ගැන්වීම</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් උද්ගතව ඇති ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡා කර ලබා ගත් තීරණයකට අනුව උක්ත කරුණට අදාළ නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍ය වී ඇත.

02. ඒ අනුව අඩු සුදුසුකම් සහිත හඳුනාගත් නිලධාරීන් වයස අවුරුදු 55 වන විට විශ්‍රාම ගැන්විය යුතු වුවද, ඔවුන්ගේ යම් යම් හේතු මත එම වයස් සීමාව ඉක්මවා සේවය කළ නිලධාරීන් පිරිසක් සිටින බව තහවුරු වී ඇත. එසේ සේවය කරන ලද නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සැකසීම ගැටළුකාරී තත්වයක් බව දන්වන අතර එය කඩිනමින් විසඳා ගත යුතුව ඇත.

03. ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

- වයස අවුරුදු 55න් ඔබ්බට සේවය කරන ලද අඩු සුදුසුකම් සහිත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම සඳහා (මා විසින් සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් අමතන ලද මගේ සමාංක හා 2025.12.31 දිනැති ලිපියෙන් ඉල්ලා ඇති පරිදි) 2026.01.15 දින වන විට වයස අවුරුදු 55න් ඔබ්බට සේවය කළ සියළුම නිලධාරීන්ගේ නාම ලේඛනයක් ලබා දීමට කඩිනමින් කටයුතු කිරීම.
- 2026.01.15 දිනෙන් පසු විශ්‍රාම වැටුපට එළඹෙන සියළුම අඩු සුදුසුකම් සහිත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් නියමිත දිනට වහාම සේවයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කිරීම.

05. මෙ සම්බන්ධයෙන් අදාළ තොරතුරු අමාත්‍යාංශ ලේකම් වෙත කඩිනමින් ලබා දියයුතු බැවින් 2026.01.23 දින දහවල් 12.00ට පෙර ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

06. උක්ත උපදෙස් පරිදි කටයුතු නොකිරීම තුළ යම් මූල්‍යමය අලාභයක් රජයට ගෙවීමට සිදු වුවහොත් එම අලාභය ඒ සම්බන්ධයෙන් වගකිව යුතු සියළුම නිලධාරීන් විසින් ගෙවීමට කටයුතු කළ යුතුය.

07. තවද මුදල් රෙගුලාසි 104(1) හා ආයතන සංග්‍රහයෙහි XLVIII පරිච්ඡේදයෙහි පළමු උපලේඛනයේ 14 සහ 31:1: 14 වන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා. දැ. ගැ. ස.